# ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවක් පදනම් කරගත් ප්‍රශ්න සහ පිළිතුරු

ගෙවීම් සහ පියවීම් පද්ධතිය සහ මුදල් විශුද්ධිකරණ කාර්යයන් පිළිබඳව පැවති සම්මුඛ සාකච්ඡාව

1. **ගෙවීම් කාඩ්පත් භාවිතයේ දී මෙන්ම මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය තුළදී රටෙහි බැංකු ක්‍රමය අවදානමකට පාත්‍රවිය හැක. මෙමගින් රටෙහි බැංකු ක්‍රමය මෙන්ම සමස්ත මූල්‍ය පද්ධතිය අයුතු ලෙස භාවිතා කිරීමට යම් යම් පාර්ශ්වයන්ට හැකිවේ. එනිසා පළමුවෙන්ම ශ්‍රී ලංකාවේ බැංකු ක්‍රමය ගැන කිසියම් හැඳින්වීමක් කළ හැකිද?**

<u>**ශ්‍රී ලංකාවේ බැංකු ක්‍රමය**</u>

සමස්ත ආර්ථිකයේම ගනුදෙනු සඳහා අවශ්‍ය මුදල් සහ ද්‍රවශීලතාව සැපයීම බැංකු ක්‍රමය තුළින් සිදුවන අතර බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු මෙයට අයත් වේ. එමෙන්ම ආයතනයන්හි මූල්‍ය ගනුදෙනු පවත්වාගෙන යාමට අවශ්‍ය ගෙවීම් සේවා පවත්වාගෙන යාමද මෙම බැංකු පද්ධතිය මගින් සිදුවේ. දැනට ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය බලපත්‍රලාභී වාණිජ බැංකු 26 කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 7 කින් සමන්විත වේ. මෙය අපට ආර්ථිකයේ හදවත ලෙස හැඳින්විය හැක.

බැංකු ක්‍රමයේ ස්ථායිතාවය ඉතාම වැදගත් වන අතර මෙය ද්‍රවශීලතාව සහ ගනුදෙනු මනාව පවත්වාගෙන යෑම සඳහා ද බැංකු ක්‍රමය කෙරෙහි මහජන විශ්වාසය ඇති කර ගැනීම සඳහා ද ඉතාම වැදගත් වේ.

බැංකු අංශයේ වත්කම් රුපියල් ට්‍රිලියන 12 යි

මූල්‍ය පද්ධතියේ වත්කම් රුපියල් ට්‍රිලියන 17 යි

ලියාපදිංචි මූල්‍ය සමාගම් හා විශේෂිත කල්බදු සමාගම් හි වත්කම් රුපියල් ට්‍රිලියන1.4 යි

2. **ගෙවීම් කාඩ්පතක් යනු කුමක්ද? එය කෙසේ බැංකු ක්‍රමය තුළ භාවිතා වන්නේ ද? කෙටියෙන් සඳහන් කරන්න**

ගෙවීම් කාඩ්පතක් යනු ගනුදෙනුකරුවෙකුට බැංකු ශාඛාවකට පැමිණීමකින් තොරව ටෙලර් යන්ත්‍ර, විකුණුම්පොළ ගෙවීම් යන්ත්‍ර හා අන්තර්ජාලය (මංගත ගෙවීම් පහසුකම්)

ආදී මාධ්‍යයන් භාවිතා කොට තමා සතු බැංකු ගිණුමට සම්බන්ධ මුදල් ලබා ගැනීම හෝ ගෙවීම් සිදුකිරීමට පහසුකම් සලසන කාඩ්පතයි.

## දැනට ලෝකයේ භාවිතාවේ පවතින ගෙවීම් කාඩ්පත් වර්ග මොනවාද?

ගෙවීම් කාඩ්පත් මූලිකව වර්ග 4 කි.

හර කාඩ්පත් (Debit Card)

ණය කාඩ්පත් (Credit Card)

අයභාර කාඩ්පත් (Charge Card)

අගය රාශිගත කාඩ්පත් (Stored-Value Card)

## 3. දැනට මෙම කාඩ්පත්වලින් කරනු ලබන ගෙවීම් පිළිබඳව එහි ජනප්‍රියතාවය, ප්‍රචලිතභාවය හා එහි වැදගත්කම පිළිබඳව කිසියම් අදහසක් ලබාදිය හැකිද?

## ඒ පිළිබඳව පවත්නා සංඛ්‍යා ලේඛණයන් හා දත්තයන් කවරේද?

මුදල් නොවන ගනුදෙනු භාවිතය ප්‍රථමයෙන් ආරම්භ වූයේ 1990 දශකයේ දී ය. මෙය 2010 පමණ වන විට විශේෂයෙන්ම විද්‍යුත් බැංකුකරණයත් සමඟ පුළුල්ව පැතිර යාමට පටන් ගැණින. 2016 දී ඇමරිකා එක්සත් ජනපදයේ සිදුකරන ලද සමීක්ෂණයකට අනුව එම සමීක්ෂණයට භාජනය වූ පුද්ගලයන්ගෙන් සියයට 75 ක් ම ගෙවීම් මාධ්‍යයක් ලෙස හර හා බැර පත් සඳහා සිය කැමැත්ත පළ කර ඇති අතර මුදල් සඳහා කැමැත්ත පළකර තිබුණේ සියයට 11 ක් පමණි (මූලාශ්‍රය: ‘2016 US Consumer payment Study’, 2016). එමෙන්ම ස්වීඩනයේ මුදල් භාවිතය මුළු ගනුදෙනු වල වටිනාකමින් 2% ක් පමණ වූ ඉතාම සුළු ප්‍රමාණයකට සීමා විය (මූලාශ්‍රය:‘People in Sweden barely use cash – and that’s sounding alarm bells for the country’s Central bank’, Browne Ryan, 2018).

ගෙවීම් මාධ්‍යයක් ලෙස මුදල් බහුලව භාවිතා නොකරන රාජ්‍යයන් අතර නෝර්වීජියානු රටවල් ප්‍රමුඛත්වයක් ගනී. එමෙන්ම මෙම ක්ෂේත්‍රයේ කරන ලද සමීක්ෂණයන්ට අනුව සිංගප්පූරුව මුළු ගනුදෙනුවලින් 61% ක් පමණ කාඩ්පත් මගින් කරනු ලබයි (මූලාශ්‍රය: ‘Future of Cashless Payments in Singapore’, Frost & Sullivan, Lee, Quah Mei, 2018).

දැන් ලංකාවේ හර කාඩ්පත් මිලියන 21 ක් පමණ භාවිතයේ පවතී. මීට අමතරව ණය කාඩ්පත් මිලියන 1.6 ක් පමණ භාවිතයේ පවතී.

## 4. ශ්‍රී ලංකාව තුළ ගෙවීම් කාඩ්පත් විකාශනය සහ දැනට ගෙවීම් කාඩ්පත්වල සංයුතීන් පැහැදිලි කරන්න.

1986 වර්ෂයේදී ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) ශ්‍රී ලංකාවට හඳුන්වා දී තිබේ.

1989 වර්ෂයේදී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකාව තුළ ක්‍රෙඩිට් කාඩ්පත් නිකුත් කිරීම ආරම්භ කරන ලදී. (මූලාශ්‍රය: Payment Bulletin, Q3, 2018)

1994 වර්ෂයේදී POS යන්ත්‍ර මෙරට ස්ථාපිත කළ අතර හර කාඩ්පත් මුලින්ම ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්නේ 1997 වර්ෂයේදීය. (මූලාශ්‍රය: Payment Bulletin, Q3, 2018)

ගනුදෙනුකරුවන් හට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයකින් හෝ විකුණුම්පොළ ගෙවීම් යන්ත්‍රයක් (POS) ඇති ස්ථානවලදී තම ගෙවීම් කාඩ්පත් හා සම්බන්ධ පහසුකම් ලබාගත හැකි අතර 2018 තුන්වන කාර්තුව අවසන් වන විට ශ්‍රී ලංකාව තුළ,

POS යන්ත්‍ර - 59,419 ක් සහ

ATM යන්ත්‍ර - 4,496 ක් භාවිතා වේ.

මීට අමතරව ගෙවීම් කාඩ්පත් හිමිකරුවන් හට අන්තර්ජාලය ඔස්සේ ද තම කාඩ්පත් උපයෝගී කොටගෙන ගනුදෙනු සිදු කළ හැක.

**ගෙවීම් කාඩ්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ වන ආයතන මොනවාද ?**

ශ්‍රී ලංකා මහ බැංකුව - බලපත්‍ර නිකුත් කිරීමේ අධිකාරිය

බලපත්‍රලාභී සේවා සැපයුම් කරුවන්

## 5. ගෙවීම් කාඩ් නිකුතුවට හෝ හඳුන්වා දීමට අවසර ගත යුතුද ? එම අවසර ගත යුත්තේ කිනම් ආයතනකින්ද ?

ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අවසර ලබාගත යුතුය.

කාඩ්පත් සේවා සැපයුම්කරුවෙක් ලෙස බලපත්‍ර අයදුම් කිරීමට සුදුසුකම් ලබන්නේ;

- බලපත්‍රලාභී වාණිජ බැංකු
- බලපත්‍රලාභී විශේෂිත බැංකු
- ලියාපදිංචි මූල්‍ය සමාගම්
- 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත අනුව නිකුත් කරන ලද බලපත්‍ර සහිත ජංගම දුරකථන සේවා සැපයුම්කරුවන්
- 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි අක්වෙරළ හෝ විදේශ සමාගමක් හැර, අවම වශයෙන් මිලියන 150 කට අඩු නොවූ ප්‍රාග්ධනයක් හෝ මහ බැංකුව විසින් නියම කරන ලද වෙනත් ප්‍රමාණයකට අඩු නොවූ ප්‍රාග්ධනයක් සහිත සමාගම්

## 6. ශ්‍රී ලංකාව තුළ ගෙවීම් කාඩ්පත් භාවිතයේදී දැනට පවතින රෙගුලාසි මොනවාද?

පනත්, රෙගුලාසි හා විධිවිධාන;

- 2005 අංක 28 දරන ගෙවීම් හා බේරුම් කිරීමේ පද්ධති පනත
- 2009 අක 1 දරන ගෙවීම් කාඩ්පත් ආශ්‍රිත සේවා සපයන්නන් සඳහා වන රෙගුලාසි 2009 වසරේ නිකුත් කරන ලද අතර 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝග මගින් ප්‍රතිස්ථාපනය කරන ලදී.
- 2010 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධතිය සඳහා වන නියෝග යටතේ නිකුත් කරන ලද ගෙවීම් කාඩ්පත් මගින් සිදුකරන විද්‍යුත් වාණිජ (e-commerce) ගනුදෙනු අත්පත් කරගැනීම සඳහා වූ විධිවිධාන.

## 7. කාඩ්පත් මගින් ගනුදෙනු කිරීමේදී ගනුදෙනුකරුවන්ට මුහුණ දීමට සිදුවන අවදානම් සහ ගැටළු

කාඩ්පත් මගින් ගනුදෙනු කිරීමට යාමේදී, වංචාකරුවන් විසින් රහස්‍ය අංකය හා කාඩ්පත් ආශ්‍රිත දත්ත සොරකම් කිරීමේ හැකියාව ඇත. පසුගිය කාලයේ වාර්තා වූ පරිදි සැඟවූ කැමරා යොදා ගෙන ගනුදෙනුකරුවන්ගේ රහස්‍ය අංකයන්, කාඩ්පත් කියවීමේ උපාංග යෙදා ගෙන කාඩ්පත් දත්ත සොරාගැනීමක් සිදුකර ඇත.

මෙවැනි අවස්ථා මගහැරීම සඳහා ගනුදෙකරුවන්ගේ විමසිලිමත් බව අත්‍යාවශ්‍ය වේ.

කාඩ්පත් ආශ්‍රිත ගනුදෙනු කිරීමට යාමේදී ATM යන්ත්‍රයට සැක කටයුතු උපාංග සවිකර ඇත්දැයි බලන්න. එසේ ඇත්නම් වහාම අදාළ බැංකුව වෙත දැනුම් දෙන්න.

හඳුනාගත නොහැකි හෝ අනවසර ගනුදෙනුවක් හෝ අහිමි වූ හෝ අස්ථානගත වූ කාඩ්පත් වේ නම්, එවැනි සිදුවීම් වහාම අදාළ බැංකුව වෙත දැනුම් දෙන්න.

## 8. පසුගිය කාලයේදී, ATM යන්ත්‍ර මගින් මුදල් ලබා ගැනීමේ වංචාවන් ගැන පුවත්පත්වලින් වාර්තා වුනා. ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න. වංචා අවම කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙන ඇති පියවර මොනවාද?

ගනුදෙනුකරුවන්ගේ පූර්ණ සුරක්ෂිතභාවය සුරැකීම සඳහා ගෙවුම් කාඩ්පත සහ ATM යන්ත්‍රය යන දෙකම EMV තාක්ෂණයෙන් (Europay, Mastercard and Visa) අනුන විය යුතුය. නමුත් තවමත් සමහර බැංකුවලට අයත් ATM ජාලයන් සම්පූර්ණයෙන්ම EMV සක්‍රීය වී නොමැත.

මීට කලින් පැහැදිලි කළ ආකාරයට EMV සක්‍රීය නොමැති ATM යන්ත්‍ර වලින් සිදුකරන EMV සක්‍රීය කාඩ්පත් ගනුදෙනු ආශ්‍රිතව සිදුවන මූල්‍යමය වංචා සඳහා අදාළ බැංකුව වගකිව යුතු වේ.

මෙවැනි අවස්ථාවල සිදුවිය හැකි පාඩු හා සම්පූර්ණ ATM ජාලයේ සිදුවිය හැකි වංචා මගහරවා ගැනීම සඳහා බැංකුව වෙනත් බැංකු ගිණුම්වලින් මුදල් ලබාගැනීමේ හැකියාව තාවකාලිකව අත්හිටුවනු ලබයි.

ඉහත ක්‍රමවේදයට අමතරව ඔබගේ කාඩ්පත් ගනුදෙනු හා සම්බන්ධ තත්කාලීන විස්තර කෙටි පණිවිඩ ඔස්සේ තම පෞද්ගලික ජංගම දුරකථනයට ලබා ගත හැකිය. මෙම කෙටි පණිවිඩ සේවාව මගින් ලැබෙන තොරතුරු අනුව තම කාඩ්පත භාවිත කර ගනුදෙනු සිදුකර ඇත්තේ තමා විසින් ම ද යන වග අදාළ මෙහොතේම ගනුදෙනුකරුට නිරීක්ෂණය කළ හැකි වේ. තමා විසින් කාඩ්පත භාවිතා නොකරන අවස්ථාවකදී එවැනි කෙටි පණිවුඩයක් මගින් එවැනි ගනුදෙනුවක් සම්බන්ධව දැනුවත් වුවහොත් ක්ෂණිකව ඊට අදාළ පියවර ගෙන (කාඩ්පත තාවකාලිකව අවලංගු කිරීම වැනි) සිදු වන හානිය අවම කර ගැනීමටද ගනුදෙනුකරුවන්ට හැකියාව ඇත.

## 9. EMV (Europay, Mastercard and Visa) තාක්ෂණය යනු කුමක්ද? එය විශේෂ වන්නේ ඇයි ? එහි වර්ථමාන තත්වය පිළිබඳව පැහැදිළි කරන්න.

මෙම තාක්ෂණය ඇතුළත් කොට නිෂ්පාදිත කාඩ්පත් තුළ කුඩා ඉලෙක්ට්‍රොනික පරිපථයක් ඇතුළත් කර ඇති අතර ඒ මගින් කාඩ්පතට අදාළ සංවේදී දත්ත ගබඩා කර තබයි. EMV තාක්ෂණය පහසුකම් සහිත ටෙලර් යන්ත්‍රය මගින් මෙම කාඩ්පත්වල දත්ත කියවිය හැකි අතර එම ක්‍රියාවලිය චුම්භක තාක්ෂණය ඔස්සේ නිෂ්පාදිත සාමාන්‍ය කාඩ්පතකට වඩා ඉහළ ආරක්ෂණ ක්‍රමවේදයක් ඔස්සේ සිදුවන බැවින් කාඩ්පත් දත්ත සොරා ගැනීම උපරිම ලෙස සීමා කළ හැකිය.

මේ වන විට සියලුම ආයතන තම ගනුදෙනුකරුවන් සඳහා EMV තාක්ෂණයෙන් යුතු කාඩ්පත් නිෂ්පාදනය කොට නිකුත් කරමින් පවතින අතර අදාළ ටෙලර් යන්ත්‍ර හා ගෙවුම් පොළ ගෙවීම් යන්ත්‍ර EMV තාක්ෂණයට ඇතුළත් කරමින් යාවත්කාලීන කිරීමේ කටයුතුවල නිරත වෙමින් පවතින බැවින් පද්ධතිය තුළ ඇති සියලුම කාඩ්පත් වෙත EMV තාක්ෂණය ඇතුළත් කිරීමට යම්කිසි කාලයක් ගතවනු ඇත.

EMV තාක්ෂණය නොමැති යන්ත්‍රයකින් කාඩ්පත් වංචාවක් සිදු වුවහොත් පාරිභෝගිකයා විසින් අලාභය විඳ දරා ගත යුතු ද?

EMV තාක්ෂණය රහිත ATM යන්ත්‍රයක් මගින් EMV තාක්ෂණය සහිත හා රහිත කාඩ්පත් මගින් ගනුදෙනු කළ හැක.

<u>EMV තාක්ෂණය සහිත කාඩ්පත් භාවිතය</u>

EMV තාක්ෂණය සහිත කාඩ්පත් මගින් EMV තාක්ෂණය රහිත ATM යන්ත්‍රයකින් මුදල් ගැනීමේදී සිදුවිය හැකි වංචාවල වගකීම ATM යන්ත්‍රය ස්ථාපිත කරන ලද බැංකුව සතුවේ.

<u>EMV තාක්ෂණය රහිත කාඩ්පත් භාවිතය</u>

EMV තාක්ෂණය රහිත කාඩ්පත් භාවිතයෙන් EMV තාක්ෂණය රහිත ATM මගින් මුදල් ලබාගැනීමේදී සිදුවන වංචා සඳහා වගකීම කාඩ්පත් නිකුත් කළ බැංකුව/ ආයතනය සතුවේ.

## 10. ගෙවීම් පද්ධතියෙහි සුරක්ෂිතතාවය පිණිසත්, මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව පිලිබඳවත් අප සැමදෙනාම දතයුතු දෑ සහ පිළිපැදිය යුතු දෑ කවරේද?

කාඩ්පත් මගින් කරනු ලබන ගෙවීම් කටයුතුවලදී තමන්ගේ රහස් අංකය අන් අයට නොපෙනෙන සේ භාවිතා කළ යුතු අතර එය වරින්වර වෙනස් කරගත යුතු ය.

එමෙන්ම ආරක්ෂිත විද්‍යුත් පරිපථය සහිත කාඩ් භාවිතා කිරීම සඳහා ක්‍රියාකළ යුතු අතර, තමන්ගේ ජංගම දුරකතන අංකය මූල්‍ය ආයතන වෙත ලබාදීම මගින් කෙටි පණිවිඩයක් මගින් තම ගනු ගනුදෙනුව තහවුරු කරන ලෙස දැනුම් දිය යුතුය.

සැක කටයුතු ගනුදෙනු පිළිබඳ නිරතුරු විමසිල්ලෙන් පසු විය යුතුය. ඒවා ආයතනයෙහි අනුකූලතා නිලධාරී වෙත, මූල්‍ය බුද්ධි ඒකකය වෙත සෘජුවම වාර්තා කළ හැක. මේ සඳහා මනා සහයක් බැංකු සහ මූල්‍ය ආයතන තුළින් ද ලබාදීම අත්‍යවශ්‍ය වේ.

## 11. මුදල් විශුද්ධිකරණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

මුදල් විශුද්ධිකරණය යනු, නීත්‍යානුකූල නොවන ක්‍රියාවන්ගෙන් උපයන ලද මුදල් එහි නීත්‍යානුකූල නොවන සම්භවය සැඟවීම සඳහා සිදුකරනු ලබන ක්‍රියාවලියයි. මුදල් විශුද්ධිකරුවන් ඔවුන්ගේ සාපරාධී මූලාශ්‍රයන් සැඟවීම සඳහා නීත්‍යානුකූල නොවන අරමුදල් නීත්‍යානුකූල මාධ්‍යයන් හරහා යවනු ලබන අතර, ඒවා නීත්‍යානුකූල වත්කම් බවට පත් කරයි.

<u>මුදල් විශුද්ධිකරණයේ අදියරයන්</u>

පළමු අදියර - ස්ථානගත කිරීම

මෙම ක්‍රියාවලියේ ආරම්භක අදියර තුළ සිදුවන්නේ නීත්‍යානුකූල නොවන මාර්ගයන් ඔස්සේ උපයාගත් අරමුදල්, සාමාන්‍යයෙන් මූල්‍ය ආයතනයන් හරහා මූල්‍ය පද්ධතිය තුළට යොමු කිරීමයි. බැංකු ගිණුමකට මුදල් තැන්පත් කිරීම හෝ කොටස් මිලදී ගැනීම හෝ රක්ෂණ ගිවිසුම් ඇති කර ගැනීම තුළින් මෙය සිදුකළ හැකිය.

දෙවන අදියර - ඇතිරීම

මුදල් විශුද්ධිකරණයෙහි දෙවන අදියර වන මෙම අදියර තුළදී සිදුවනුයේ නීත්‍යානුකූල නොවන මූලාශ්‍ර හරහා උපයාගත් අරමුදල් තැන්පතු, සුරැකුම්පත් හෝ රක්ෂණ ගිවිසුම්

ආදී ලෙස මූල්‍ය පද්ධතිය තුළට ඇතුළත් කිරීමෙන් පසුව එහි සාපරාධී මූලාශ්‍රයන් සැඟවීම සඳහා තවදුරටත් එම අරමුදල් වෙනත් ආයතන වෙත මාරු කිරීම හෝ වෙනත් වත්කම් බවට පරිවර්තනය කිරීමයි.

තුන්වන අදියර - ඒකාබද්ධකරණය

ඒකාබද්ධකරණය නමින් හඳුන්වන තුන්වන අදියරේ දී සිදුවන්නේ අරමුදල් නීත්‍යානුකූල අංශයන්ට යොමු කිරීමයි. නිශ්චල දේපළ, සුරැකුම්පත්, අනෙකුත් මූල්‍ය වත්කම් හෝ මෝටර් රථ, මැණික් හෝ ස්වර්ණාභරණ වැනි සුඛෝපභෝගී භාණ්ඩ මිලදී ගැනීම තුළින් මෙම ක්‍රියාවන් සිදු කරයි.

### මුදල් විශුද්ධිකරණයට අදාළ මූලික වැරදි (සාපරාධී මූලාශ්‍රයන්) කෙටියෙන් දක්වන්න.

පහත නෛතික නොවන මාර්ගයන්ගෙන් උපයන මුදල්, මුදල් විශුද්ධිකරණයට අදාළ මූලික වැරදි ලෙස දැක්විය හැකිය.

- මත්ද්‍රව්‍ය ජාවාරම
- පුද්ගල/මිනිස් ජාවාරම
- වංචා සහ දූෂණ
- අවි ආයුධ ජාවාරම
- බැංකු පනතේ 83 (ඇ) වගන්තිය උල්ලංඝනය කිරීම
- ළමයින්ට එරෙහි වැරදි
- මරණීය දණ්ඩනය හෝ වසර පහකට වැඩි සිර දණ්ඩනය හිමිවන ඕනෑම වරදක්

## 12. මුදල් විශුද්ධිකරණ කාර්යයන් මූල්‍ය පද්ධතියට ඇති කරනු ලබන බලපෑම කුමක්ද? ඒ පිළිබඳව අප සැලකිලිමත් විය යුත්තේ ඇයි?

- මුදල් විශුද්ධිකරණය/ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම ව්‍යාප්ත වීම තුළින් මූල්‍ය පද්ධතියේ ස්ථාවර භාවයට අහිතකර බලපෑම් ඇති කරයි.
- අන්තර්ජාතික වශයෙන් ක්‍රියාත්මක වන මූල්‍ය ආයතන, මූල්‍ය වෙළෙඳපොළවල් සමඟ සම්බන්ධතා ඇති කරගැනීම අපහසු වේ.
- සමාජයීය වශයෙන් ඇතිවන අයහපත් බලපෑම් මත මූල්‍ය පද්ධතියට ඇතිවන බලපෑම්

- මූල්‍ය ආයතනවලට තනි තනිවත්, මූල්‍ය පද්ධතිය ලෙස පොදුවේත් සිදුවිය හැකි කීර්ති නාමයට හානි සිදුවීම්
- ජාත්‍යන්තරව ශ්‍රී ලංකාවේ කීර්ති නාමයට බලපෑම් ඇතිවීම තුළින් ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීමට නොහැකි වීම.
- විදේශ ආයෝජන ආකර්ශනය කර ගැනීමේදී ඇතිවන ගැටළු

## 13. මූල්‍ය බුද්ධි ඒකකය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? මෙම මූල්‍ය බුද්ධි ඒකක සැමවිටම පිහිටුවා ඇත්තේ මහ බැංකුවලට සම්බන්ධවද ?

## ලොව ඇති අනිකුත් මූල්‍ය බුද්ධි ඒකකයන් වර්ග මොනවාද?

මූල්‍ය බුද්ධි ඒකකය යනු,

(අ) සැකකටයුතු ගනුදෙනු වාර්තා, (ආ) මුදල් විශුද්ධිකරණය, ඒ ආශ්‍රිත මූලික වැරදි සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධ තොරතුරු ලබා ගන්නා සහ ඒවා විශ්ලේෂණය කර එම විශ්ලේෂණයන්ගේ ප්‍රතිඵල බෙදාහැරීම සඳහා වන ජාතික මධ්‍යස්ථානයකි. මූල්‍ය බුද්ධි ඒකකයන් පිහිටුවීමේ දී ප්‍රධාන කාරණා කිහිපයක් සැලකිල්ලට ගනී: මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නීති, පවත්නා නීති ක්‍රියාත්මක කිරීම සහ මූල්‍ය තොරතුරු ලබා ගැනීම, තක්සේරු කිරීම සඳහා වූ ආයතනයක අවශ්‍යතාවය, ඒවා අතර වේ.

ඇතැම් රටවල පමණක් මහ බැංකුවට අනුබද්ධිතව පිහිටුවා ඇත.

උදාහරණ ලෙස ශ්‍රී ලංකාව, මැලේසියාව, පිලිපීනය

<u>**ලොව ඇති අනිකුත් මූල්‍ය බුද්ධි ඒකකයන් වර්ග මොනවාද?**</u>

**අධිකරණ ආකෘතිය:** රටේ අධිකරණ පද්ධතියට අනුබද්ධ ආයතනයක් ලෙස පිහිටුවීම.

**නීතිය ක්‍රියාත්මක කිරීමේ ආකෘතිය:** දැනට පවත්නා නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයන් සමග මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා වූ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම.

**පරිපාලන ආකෘතිය:** මූල්‍ය අංශයෙන් තොරතුරු ලබා ගන්නා සහ ඒවා සම්බන්ධ කටයුතු කරනු ලබන මධ්‍යගත, ස්වාධීන, පරිපාලන අධිකාරියක් ලෙස පිහිටුවීම.

**දෙමුහුන් ආකෘතිය:** මෙහිදී මූල්‍ය බුද්ධි ඒකකය හෙළිදරව් කිරීමේ අතරමැදියෙකු ලෙස මෙන්ම අධිකරණ සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සමග සම්බන්ධව කටයුතු කරයි.

## 14. ත්‍රස්තවාදය සඳහා අරමුදල් සැපයීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම යනු, ඕනෑම ආකාරයක ත්‍රස්තවාදී ක්‍රියාවක් සඳහා මූල්‍යමය ආධාර සැපයීම හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක් සඳහා දිරිගැන්වීම, සැලසුම් කිරීම හෝ එවැනි ක්‍රියාවක නිරත වීමයි. ත්‍රස්තවාදී ක්‍රියා සඳහා ආධාර දීමට යොදා ගන්නා අරමුදල් නීත්‍යානුකූල මූලාශ්‍රවලින් හෝ සාපරාධී ක්‍රියාකාරකම්වලින් හෝ එම දෙආකාරයෙන්ම උත්පාදනය විය හැක.

මේ මගින් ආර්ථික මර්මස්ථානවලට ප්‍රහාර එල්ල කිරීම තුළින් ආර්ථික ස්ථායිතාවයට දරුණු පහරක් එල්ල වේ.

උදාහරණ ලෙස, 1996 මහ බැංකු බෝම්බ ප්‍රහාරය, 2001/09/11 ඇමරිකාවේ වෙළෙඳ මධ්‍යස්ථානයට එල්ල වූ ප්‍රහාරය

## 15. මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැලැක්වීම සම්බන්ධව ශ්‍රී ලංකාවේ පවතින අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ නෛතික රාමුවේ පවතින නීති මොනවාද?

ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ නෛතික රාමුව පනත් 3 කින් සමන්විත වේ.

(අ) 2005 අංක 25 දරන ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත.

- 2011 අංක 41 දරන ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත.
- 2013 අංක 3 දරන ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත.

(ආ) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත.

2011 අංක 40 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත.

(ඇ) 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත.

### 16. මුදල් විශුද්ධිකරණ කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට තනිව කටයුතු කළ නොහැකි අතර ජාත්‍යන්තර වශයෙන් සහයෝගිතා ගොඩනගා ගැනීම මෙන්ම වර්ධනය කරගැනීම් ඉතාම අවශ්‍යය. මෙහිදී අපගේ කාර්යභාරය සහ අප විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?

මුදල් විශුද්ධිකරණ කටයුතු වැළැක්වීම සඳහා ජාත්‍යන්තර ආයතන රාශියක් සමඟ මූල්‍ය බුද්ධි ඒකකය අත්වැල් බැඳගෙන සිටී. මේ අතර මූල්‍ය කාර්ය සාධක බලකාය, මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම ප්‍රධාන තැනක් ගනියි. මීට අමතරව එක්සත් ජාතීන්ගේ සංවිධානය, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ආසියානු සංවර්ධන බැංකුව සමඟ ද කටයුතු කරනු ලැබේ.

ගෙවීම් සහ පියවීම් කටයුතු සම්බන්ධව ජාත්‍යන්තර ආයතන සමඟ ඉතා සමීපව කටයුතු කරන අතර විශේෂයෙන් SEACEN සාමජික රටවල් 19 ක් සමඟ දැනුම හුවමාරු කරගනු ලබයි.

මීට අමතරව SAARCFINANCE මෙන්ම SAARC payment Council (SPC) යටතේ ඇති රටවල් සහ රටවල් 9 ක් සම්බන්ධ වී ස්ථාපනය කර ඇති ආසියානු නිශ්කාෂණ සංගමයේ (ACU) නියෝජිතයන් සමඟ එක්ව සහයෝගීතාවයක් ගොඩනඟා ගෙන ඇත.

### මූල්‍ය කාර්ය සාධක බලකාය යනු කුමක්ද?

මූල්‍ය කාර්ය සාධක බලකාය යනු G7 සාමාජික රටවල අමාත්‍යවරුන් විසින් 1989 වසරේ දී පිහිටුවාගන්නා ලද අන්තර්-රාජ්‍ය සංවිධානයකි. මූල්‍ය කාර්ය සාධක බලකායේ අරමුණු වන්නේ, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමට මෙන්ම මූල්‍ය පද්ධතියේ ඒකාග්‍රතාවය හා සම්බන්ධ අනෙකුත් අවදානම් මග හරවා ගැනීම සඳහා ප්‍රමිති සකස් කිරීම හා නීතිමය, නියාමන හා මෙහෙයුම් ක්‍රියාමර්ග ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීම වේ.

වර්තමානයේ දී, සාමාජිකයන් 38 ක් සහ කලාපීය නිරීක්ෂණ ආයතන හා නිරීක්ෂණ සංවිධාන 9 ක් මූල්‍ය කාර්ය සාධක බලකායට අයත් වේ.

## මුදල් විශුද්ධි කරණය පිලිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම යනු කුමක්ද?

1997 දී ස්ථාපනය කරන ලද මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම, මූල්‍ය කාර්ය සාධක බලකායේ විශාලතම කලාපීය නිරීක්ෂණ ආයතනයයි. වර්තමානයේ රටවල් 41 ක් හා නිරීක්ෂණ සංවිධාන කිහිපයක් මෙම මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ සාමජිකයන් වන අතර ශ්‍රී ලංකාව එහි ආරම්භක සාමාජිකයෙකි. එහි මූලික කාර්යභාරය වනුයේ මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශවලට කලාපීය රටවල් දක්වන අනුකූලතාවය නිරීක්ෂණය කිරීමයි.

## 17. මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට අදාළ වන ආයතන කවරේද ?

(අ) මූල්‍ය ව්‍යාපාරවල නියැලී සිටින ආයතන

උදා:- බලපත්‍රලාභී බැංකු, මූල්‍ය ආයතන, කොටස් තැරැව්කරුවන්, රක්ෂණ සමාගම්, මුදල් මාරු කරන්නන්, මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන්.

(ආ) නම්කරන ලද මූල්‍යමය නොවන ව්‍යාපාර හා වෘත්තීන්වල නියැලී සිටින ආයතන.

උදා:- කැසිනෝ, නිශ්චල දේපළ වෙළෙඳුන්, මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳුන්, නීතිඥයන්, ගණකාධිකාරීවරුන්, භාර හෝ සමාගම් සේවා සපයන්නන්.

## 18. සැකකටයුතු වාර්තාවක්/ගනුදෙනුවක් යනු කුමක්ද?

සැක කටයුතු වාර්තාවක් යනු මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම හෝ අදාළ වෙනත් ඕනෑම සාපරාධී වරදක් හා සම්බන්ධ ගනුදෙනුවක් යැයි සැක කිරීමට සාධාරණ හේතු ඇති අවස්ථාවක ගොනු කරන වාර්තාවකි. සිදු කළ ගනුදෙනුවක් හෝ ගනුදෙනු කිරීමට තැත් කිරීමක් සැක කටයුතු ගනුදෙනු යන්නට ඇතුළත් විය හැකිය.

මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 7 වන වගන්තියට අනුව, මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම හා අදාළ ඕනෑම ගනුදෙනුවක් සම්බන්ධයෙන් සාධාරණ සැකයක් ඇති ඕනෑම ආයතනයක් විසින් සැක කටයුතු ගනුදෙනු වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය. ආයතනය යන්නෙන්, යම් මූල්‍ය

ව්‍යාපාරයක හෝ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයක නිරත වූ හෝ ඒවා කරගෙන යනු ලබන යම් තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

සියලු සැක කටයුතු ගනුදෙනු වාර්තා අධ්‍යක්ෂ, මූල්‍ය බුද්ධි ඒකකය වෙත යොමු කළ යුතුය. වාර්තා කරනු ලබන සියලුම සැක කටයුතු ගනුදෙනුවල රහස්‍යභාවය සුරැකීමට මූල්‍ය බුද්ධි ඒකකය බැඳී සිටී.

මහජන පැමිණිලි ලෙස වාර්තාකරණ සැක කටයුතු ගනුදෙනු වාර්තා සද්භාවයෙන් සිදුකළ යුතු අතර (Good Faith) අවශ්‍ය සියලු තොරතුරු ලබාදිය යුතු අතරම නිර්නාමික නොවිය යුතුය.

## 19. මූල්‍ය කාර්ය සාධක බලකාය මගින් නිකුත් කර ඇති වර්ගීකරණයන් කවරේද? එය අප රට කෙරෙහි බලපාන ආකාරය - එම අයහපත් ලේඛනයෙන් අප රටෙහි නම ඉවත් කරගත හැකි ආකාරය

මූල්‍ය කාර්ය සාධක බලකාය මගින් නිකුත්කර ඇති වර්ගීකරණයන් පහත පරිදි වේ.

අ) මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට අදාළව ක්‍රියාත්මක වෙමින් පවතින සහ සැලකිය යුතු මට්ටමේ අවදානම්වලින් ජාත්‍යන්තර මූල්‍ය පද්ධතිය ආරක්ෂා කරගැනීම උදෙසා ප්‍රති පියවර ගන්නා ලෙස මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් එහි සාමාජිකයන් සහ සෙසු රටවලට දැනුම් දී ඇති රටවල් - අසාදු ලේඛන ගත රටවල් (Black List)

ඇතුළත් රට: කොරියානු ප්‍රජාතාන්ත්‍රික ජනරජය එනම් උතුරු කොරියාව

ආ) එම රටවල අවදානම් තත්ත්වයන්ට සමානුපාතිකව නිසි ප්‍රබල (enhanced due diligence) ක්‍රියාමාර්ග ගැනීම සඳහා මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් එහි සාමාජිකයන් හා සෙසු රටවලට දැනුම් දී ඇති රටවල් - තද අළු ලේඛනය (Dark Gray List)

ඇතුළත් රට: ඉරානය

ඇ) අනෙකුත් දුවශීලතා ඇති අධීක්ෂණය කරනු ලබන රටවල් - ගෝලීය වශයෙන් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතාව පිළිබඳ ක්‍රියාවලිය වැඩිදියුණු වෙමින් පවතින රටවල්. - අළු ලේඛනය (Gray List)

ඇතුළත් රටවල්: බහමාස්, බොට්ස්වානා, කාම්බෝජය , ඉතියෝපියාව, ඝානාව, පකිස්ථානය, සර්බියාව, ශ්‍රී ලංකාව, සිරියාව, ට්‍රිනිඩෑඩ් සහ ටොබැගෝ, ටියුනීසියාව, යේමනය.

මෙම තත්ත්වය අප රටට බලපාන්නේ කෙසේද?

- ජාත්‍යන්තර බැංකු කටයුතු සඳහා බලපෑම් ඇතිවීම ඇතුළු විදේශීය බැංකු ශ්‍රී ලාංකීය බැංකු සමග මූල්‍ය සම්බන්ධතා සීමා කිරීම.
- ශ්‍රී ලාංකීය ගනුදෙනුකරුවන් හා මූල්‍ය ආයතන ජාත්‍යන්තර වශයෙන් ගනුදෙනු සිදු කිරීමේදී අමතර විචක්ෂණ ක්‍රියාපටිපාටිවලට යටත් වීම.
- ජාත්‍යන්තර ණයගැනීම්වලදී ඉහළ පිරිවැයක් දැරීමට සිදුවීම.
- රටක් වශයෙන් කීර්තිනාමයට වන හානිය

## එම අයහපත් ලේඛනයෙන් අප රටෙහි නම ඉවත් කරගත හැකි ආකාරය

අළු ලේඛනයෙන් ඉවත් වීම පියවර 2ක් යටතේ සිදුවේ.

මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ලබාදුන් ක්‍රියාකාරී සැලැස්ම නියමිත කාලසීමාව තුළ සාර්ථකව අවසන් කිරීම.

එම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විවිධ ආයතන විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගවල ශක්‍යතාවය ඇගයීම සඳහා විදේශීය පසුවිපරම් කණ්ඩායමක් 2019 මැයි මාසයේ ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිතය.

එම පසුවිපරම් කණ්ඩායම ලබා දෙන වාර්තාව 2019 ජුනි මාසයේ පැවැත්වෙන මූල්‍ය කාර්ය සාධක බලකායේ සැසිවාරයට ඉදිරිපත් කරන අතර ශ්‍රී ලංකාව අළු ලේඛනයෙන් ඉවත් කිරීම සම්බන්ධ නිර්ණය එහිදී ගනු ලබයි.

## 20. යුරෝපා සංගමයේ වර්ගීකරණය සහ එහි අයහපත් බලපෑම්

මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ශ්‍රී ලංකාව අළු ලේඛනයට ඇතුළත් කිරීමත් සමඟ යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාව අසාදුලේඛන ගත කරන ලදී.

මූල්‍ය කාර්ය සාධක බලකායේ මෙන් රටවල් වර්ගීකරණය යුරෝපා සංගමය විසින් කොටස් කීපයක් යටතේ සිදුකරන අතර මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමට අදාළ ක්‍රියාමාර්ග දුර්වල යැයි හැඟෙන සියලුම රටවල් එකම ලේඛනයක වර්ගීකරණ සිදු කරනු ලබයි.

යුරෝපා සංගමය ශ්‍රී ලංකාව වර්ගීකරණය කිරීම තුළින් ඇතිවූ බලපෑම මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් අළු ලේඛන ගත කිරීමේදී ඇති වූ බලපෑමට සමාන වන අතරම ඇතැම් යුරෝපීය මූල්‍ය ආයතන ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන සමඟ ගනුදෙනු කිරීමේ සීමාවන් පැණවීම අමතර බලපෑමක් ලෙස දැක්විය හැකිය.

### මේ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග

මූල්‍ය කාර්ය සාධක බලකායේ අළු ලේඛනයෙන් ශ්‍රී ලංකාව ඉවත් වීමත් සමඟ යුරෝපා සංගමයේ රටවල් වර්ගීකරණයෙන් ශ්‍රී ලංකාව ඉවත් කිරීම පිළිබඳව යුරෝපා සංගමය විසින් සලකා බලනු ඇති බව අපේක්ෂා කෙරේ.

## 21. මෙම කරුණු සම්බන්ධයෙන් දැනට පවතින තත්ත්වය පිළිබඳව සෑහීමකට පත්වෙනවාද?

මේ සම්බන්ධයෙන් අවශ්‍ය කරන නීතිමය රාමුව හා ආයතනික රාමුව ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර ඇති අතර මූල්‍ය බුද්ධි ඒකකය සියළු ආයතන සමග සහයෝගයෙන් කටයුතු කරයි. ඒ පිළිබඳව අවශ්‍ය දැනුවත් වීමේ වැඩසටහන් නිරන්තරයෙන් සිදු කරයි.

මූල්‍ය කාර්ය සාධක බලකාය, අප විසින් ගෙන ඇති පියවර පිළිබඳව සෑහීමකට පත්වී ඇති අතර නෛතික අනුකූලතාවය තුළින් ශ්‍රී ලංකාව බොහෝ ඉදිරියට පැමිණ ඇත.

(මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශ 30කට ආසන්න ප්‍රමාණයකට ශ්‍රී ලංකාව අනුකූලතාවය දක්වා ඇත)

කෙසේ වෙතත්, මූල්‍ය බුද්ධි ඒකකය ලෙස දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව සෑහීමකට පත්වන අතරම ඒවා තවදුරටත් පුළුල් කිරීමට අප බලාපොරොත්තු වේ. මෙහිදී ජනතාවගේ දැනුවත් වීම අත්‍යවශ්‍ය වේ.

ගෙවීම් සහ පියවීම් පද්ධතිය අවදානම්වලට මුහුණ දිය හැකි වන පරිදි නවීකරණය කර ඇති අතර එය අනෙකුත් දියුණු රාජ්‍යයන් හා සැසඳෙන මට්ටමක පවතී. එමෙන්ම එම පද්ධතියේ සුරක්ෂිතතාව මෙන්ම බැංකු ගනුදෙනු සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය සියලුම පියවරයන් මූල්‍ය ආයතන වෙත දැනුම්දී ඇත. මෙහිදී නිසි පරිදි අදාළ සුරක්ෂිත පියවරයන් පිළිපැදීම අවශ්‍ය වන අතර ගනුදෙනුකරුවන් ද වඩාත් විමසිලිමත් ආකාරයෙන් කටයුතු කිරීම තුළින් ඇති විය හැකි අවදානම් අවම කර ගත හැකි වනු ඇත.

එමගින් බැංකුවල මෙන්ම මුදල් පද්ධතියෙහි ද ආරක්ෂාව සුරක්ෂිත කරගත හැකි වනු ඇත.